**පාඩම :- වෘත්තය**

**කාලච්ඡේද ගණන :- 03**

- පෙළපොතේ 1 පිටුව හොඳින් අධ්‍යයනය කරන්න. වෘත්තාකාර හැඩ ඇති තවත් වස්තු10 ක් ලියන්න.
- 1.1 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

| |
|---|
| රුපියල් දෙකේ කාසිය භාවිතා කර රූපයක් අඳින්න. ලැබෙන රූපයේ සම්පූර්ණ වක්‍ර රේඛාව වෘත්තයක් ලෙස හඳුන්වයි. |

- රුපියල් 5, රුපියල, සත පනහ යන කාසි භාවිතා කර වෘත්ත අඳින්න.
- නිවසේදී භාවිතා කරන වෘත්තාකාර හැඩ සහිත ද්‍රව්‍ය 3ක් ගෙන වෘත්ත අඳින්න.
- පෙළපොතේ පිටු අංක 3 හි ක්‍රියාකාරකම 2 නිවැරදිව අධ්‍යයනය කරන්න.
- වෘත්තාකාර ආස්තරයක් යනු කුමක්ද?

| |
|---|
| වෘත්තාකාර ආස්තරයක් සමාන කොටස් දෙකකට බෙදෙන නැමුම් රේඛා කැපෙන තැන සිට වක්‍ර දාරය මත ඕනෑම ලක්ෂ්‍යයකට ඇති දුර සමාන වේ. |

- පෙළපොතේ පිටු අංක 4 හි ක්‍රියාකාරකම 3 නිවැරදිව අධ්‍යයනය කරන්න. ඒ අනුව 1.2 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.

- පෙළපොතේ පිටු අංක 6 හා 7 හි ක්‍රියාකාරකම 4 හා 5 නිවැරදිව අධ්‍යයනය කරන්න. ඒ අනුව වෘත්ත මෝස්තර ඇසුරින් බිත්ති සැරසිල්ලකට සුදුසු නිර්මාණයක් ඇඳ වර්ණ ගන්වන්න.